**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
**e-NIC ව්‍යාපෘතිය**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

## ලංසු ආරාධනය (IFB)

# ස්වයංක්‍රීය ජෛවමිතික හඳුනාගැනීමේ පද්ධතිය (Automated Biometric Identification System) සැපයීම

## IFB අංකය: DRP/e-NIC/PRO/2024/36

1. e-NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, බී කොටස, 10 මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් **ස්වයංක්‍රීය ජෛවමිතික හඳුනාගැනීමේ පද්ධතිය** (Automated Biometric Identification System) සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ලංසු කැඳවීම **ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය** අනුව සිදු කෙරෙනු ඇත. (NCB)

3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, **2024 අගෝස්තු 07 සිට අගෝස්තු 26 දක්වා** කාලය තුළ **සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට පව 3.00 දක්වා ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී, e - NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව** වෙතින් **011-2 874 626** ඔස්සේ තොරතුරු ලබා ගත හැකි ය. එමෙන්ම, **e-NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, බී කොටස, 10 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** වෙතින් නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

4. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා යෝග්‍යතාව ලැබීමට ලංසුකරුවා පහත සඳහන් අවම සුදුසුකම් සැපිරිය යුතු වෙයි. මෙම අමතර විස්තර ලංසු ලේඛනයන් තුළ සපයා ඇත.

   a. ලංසුකරුවා **වසර පහක (05)ට වැඩි** කාලයක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් විය යුතු ය.

   b. මෙම ලංසුවට සහ ඊට අදාළ වෙනත් ලේඛනවලට අත්සන් කරන පුද්ගලයාට ඒ සඳහා වන බලය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගත් යෝජනාවකින් සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයක් මගින් ලබා දී තිබිය යුතුය.

   c. ලංසුකරුවා **ISO 27001:2022 (තත්ත්ව කළමනාකරණය)** තත්ත්ව සහතිකය ලබා තිබිය යුතුය.

   d. ලංසුකරුවා **ISO 27001:2022 (තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති)** තත්ත්ව සහතිකය ලබා තිබිය යුතුය.

   e. යෝජිත **ABIS** සේවා සපයන්නා **ISO 9001:2015** තත්ත්ව සහතිකය ලබා තිබිය යුතුය.

   f. යෝජිත **ABIS** සේවා සපයන්නා (**OEM**) **ISO 27001:2022** (තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති) තත්ත්ව සහතිකය ලබා තිබිය යුතුය.

   g. මෙම ටෙන්ඩරය සඳහා ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවා **1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත** යටතේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

   h. යෝජිත **ABIS** සේවා සපයන්නා (**OEM**) පහත මිණුම් සලකුණු වලට සහභාගී වී තිබිය යුතුය. **ELFT, MINEX 3, PFT 2, FRTE** සහ **IREX 10** විසින් මෙහෙයවනු ලැබේ.

   i. යෝජිත **ABIS** සේවා සපයන්නා (**OEM**)) පසුගිය වසර දහය (2014-2024) තුළ (2014-2024) සෑම ව්‍යාපෘතියක්ම ලොව පුරා නීතිය ක්‍රියාත්මක කරන ආයතන/රාජ්‍ය ආයතන සඳහා ඇඟිලි සලකුණු සහ මුහුණු හඳුනාගැනීමේ පද්ධති ස්ථාපනයන්ගෙන් (අවම වශයෙන් මිලියන 10ක දත්ත සමුදායන් සහිත) ව්‍යාපෘති 3ක් වත් සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

   g. **අවසන් වසර 5 තුළ (2019-2020 - 2023/2024)** ලංසුකරුවා අවම වශයෙන් **රුපියල් මිලියන 600 හෝ ඊට වැඩි** ගණනක සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් උපයා තිබිය යුතු ය.

   h. ලංසුකරුවාට මෙම ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් **ශ්‍රී ලංකා රුපියල් මිලියන 400ක** ශුද්ධ ද්‍රවශීල වත්කම් (ජංගම වත්කම් - ඉන්වෙන්ට්‍රි - ජංගම් බැරකම්) සහ/ හෝ ණය පහසුකම් තිබිය යුතු ය (ලේඛනමය සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය).

   i. ලංසුකරුවා **අවසන් වසර 5 සඳහා (2019-2020 - 2023/2024)** තම සමාගමේ විගණනය කළ ගිණුම්වල (ලාභ සහ පාඩු ගිණුම් සහ ශේෂ පත්‍ර) සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

   j. ලංසුකරුවා මෙම නිෂ්පාදනයේ මුල් උපකරණ නිෂ්පාදකයාගේ බලයලත් සේවා සැපයුම්කරුවෙකු විය යුතුය. එය සනාථ කරන ලේඛන ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතු අතර ලංසුකරුවා විසින්ම නිපදවන්නේ / පිරිනමන්නේ නොමැති උපකරණ සඳහා මෙම ලංසු ලේඛනය තුළ සපයා ඇති ආකෘතිය භාවිතා කරමින් මුල් නිෂ්පාදකයාගේ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතු ය.

   o. ලංසුකරුට අඛණ්ඩ සේවා සැපයීම සඳහා යොදවා ඇති (පැය 24 යි දින 365) සේවකයින් දෙදෙනෙකු ඇතුළු නඩත්තු සහ උපකාරක සේවා සඳහා දක්ෂ තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.

   o. ලංසුකරුට සහ නිෂ්පාදකයා අවශ්‍ය අඛණ්ඩ සේවා (පැය 24 යි දින 365) සැපයීමේ හැකියාව ඇත.

   p. පසුගිය **වසර දහය (05) තුළ (2020 - 2024)** ලංසුකරුවා කිසියම් නීතිමය කටයුත්තකට දායක වී ඇත්නම් අදාළ පාර්ශවයන් සහ මතභේදයට ලක්වූ මුදල සම්බන්ධ විස්තර සැපයිය යුතුය.

   q. **පසුගිය වසර දහයක (05) කාලය තුළ (2020 - 2024)** ලංසුකරුවා හෝ එහි අනුබද්ධ සහ පාලිත ආයතන කිසිවක්, කිසිදු රාජ්‍ය ආයතනයක් විසින් අසාධු ලේඛනගත කර නොතිබිය යුතු ය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2024 අගෝස්තු 07 සිට 2024 අගෝස්තු 26 දක්වා** වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාලය තුළ **නැවත නොගෙවනු ලබන ශ්‍රී ලංකා රුපියල් 50,000/- ක ගාස්තුවක්** ගෙවා **ව්‍යාපෘති අධ්‍යක්ෂ, e-NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, බී අංශය, 10 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකි ය. ගෙවීමේ ක්‍රමය වන්නේ **මුදල් මගින් ගෙවීමයි**.

6. පූර්ව ලංසු රැස්වීම **2024.08.14 දින ප.ව. 2.30 ට "බී" පර්යන්තය, 10 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** පිහිටි විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන අතර ඒ සඳහා උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන් හට ඒ සඳහා සහභාගි විය හැකිය.

7. **2024 අගෝස්තු 27 දින ප.ව. 2.00 හෝ ඊට පෙර**, "මුල් පිටපත" සහ "පිටපත" ලෙස සටහන් කරමින්, එක් මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා **පිටපත් දෙකකින් ප්‍රසම්පාදනය අංශය, e-NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, බී අංශය, 10 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට **දින 91 ක කාලයක් හෝ මිල දී ගන්නා විසින් දීර්ඝ කරන දිනය දක්වා** ලංසු වලංගු විය යුතු ය. **ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.** ලංසු ලබාගැනීම අවසන් වූ වහාම පැමිණීමට අපේක්ෂා කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසුව බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු කැඳවීමේ අංකය සඳහන් කළ යුතු ය. සියලුම ලංසු, ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද **ශ්‍රී.ලං.රු. 5,000,000/- (ලක්ෂ පනහක්) ලංසු සුරක්ෂණයක්** සමග ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**e-NIC ව්‍යාපෘතිය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,**
**බී කොටස, 10 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**
**2024.08.06**